කළුතර අධ්‍යාපන කළාපය
දෙවන වාර ඇගයීම - 2018

11 ශ්‍රේණිය | **ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - I පත්‍රය** | **කාලය පැය එකයි**

සැලකිය යුතුයි:

- **සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු වලින් නිවැරැදි හෝ වඩාත්ම ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අදින්න.**

1.මත්ස්‍ය නොවන සත්ව ජලජ ජීව සම්පතක් වන්නේ,
(1) තිලාපියා ය. (2) කැස්බෑව ය. (3) හයිඩ්‍රිල්ලා ය. (4) මුහුදු තෘණය.

2.උම්බලකඩ හා හාල්මැස්සන් වැඩිපුර ආනයනය කරන රට පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
(1) ඉන්දුනීසියාව සහ තායිලන්තය. (2) තායිලන්තය සහ මාලදිවයින.
(3) මාලදිවයින සහ තායිලන්තය. (4) තායිලන්තය සහ චීනය.

3.ජලජ ජීව සම්පත් කර්මාන්තයේ ඇති වක්‍ර රැකියාවක් සඳහා නිදසුනක් වන්නේ,
(1) හුනු නිෂ්පාදනය. (2) ඉස්සන් වගාව.
(3) විසිතුරු මත්ස්‍ය වගාව. (4) ජලජ පැළෑටි වගාව.

4.ශ්වසන සඳහා අවශ්‍ය ඔක්සිජන් ලබා ගැනීම සඳහා කඩොලාන වල දැකිය හැකි ලක්ෂණයක් වන්නේ,
(1) පත්‍ර කුඩා වීම. (2) කයිරු මුල් තිබීම.
(3) මාංසල මය පත්‍ර දැරීම. (4) වායුධර මුල් තිබීම.

5.ජලජ පරිසරයේ හමුවන අජීව - අජීව අන්තර් ක්‍රියාවක් වන්නේ,
(1) සහජීවනය. (2) ජල චක්‍රය.
(3) පොස්පරස් චක්‍රය. (4) ප්‍රභාසංස්ලේෂණය.

6.ගංවතුර සමඟ මිරිදිය ජීවීන්ගේ සංක්‍රමණය ඇති වීමට උදාහරණයක් වන්නේ,
(1) ආදා. (2) තිත්තයා. (3) කාවයියා. (4) මඩ කරියා.

7.කැස්බෑවන් බිජු ලන්නේ,
(1) කලපුවල. (2) ගැඹුරු මුහුදෙහි. (3) වෙරළෙහි. (4) ගල් පරවල.

8.වෙරළ ආරක්ෂක ශාකයක් වන්නේ,
(1) වැටකෙයියා. (2) හයිඩ්‍රිල්ලා. (3) ලුණුවිල. (4) පන්.

9.ජල කඳමිහයේ සිරස් ව ඉහළ හා පහළට පිහිනීම හේතුවන ශරීර හැඩය වන්නේ,
(1) අනාකූල හැඩය. (2) පාර්ශ්වික පැතලි හැඩය.
(3) ආදා හැඩය. (4) පෘෂ්ඨෝදරීය හැඩය.

10.මෝරා මඩුවා වැනි කාටිලේජ මත්ස්‍යයන්ගේ කොරපොතු වල හැඩය වන්නේ,
(1) දන්තාකාර. (2) වලයාකාර. (3) කංකතාභ. (4) ශල්කමය.

11.ජලය තුළ යම් කිසි මට්ටමක රැඳී සිටීමට දැඩි ආයාසයක් දැරීමට සිදුවන්නේ,
(1) පේශීවල සංකෝචනය නිසා. (2) පෙනහලු නොමැති වීම.
(3) කරමල් පිධානයක් නොමැති වීම. (4) වාතාශ්‍රයක් නොමැතිවීම.

12.මත්ස්‍යයන්ගේ සාමාජීය හා පාරිසරික අනුවර්තන පිළිවෙළින් දක්වා ඇත්තේ,
(1) රංචු වශයෙන් පිහිනීම හා එක් රොක්වීම.
(2) එක් රොක්වීම හා වේශාන්තරණය.
(3) වේශාන්තරණය හා පර්යටනය.
(4) පර්යටනය හා සංක්‍රමණය.

13.විසිතුරු මත්ස්‍ය වගාවක පොකුණු සඳහා ගත හැක්කේ,
(1) කුඹුරු. (2) හැල් කුඹුරු. (3) ඇළ මාර්ග. (4) පිටවාන.

14.බිත්තර විසුරුවන මත්ස්‍ය වර්ගයක් වන්නේ,
(1) ගෝල්ඩ් ෆිෂ්. (2) ඒන්ජල්. (3) ගුරාමි. (4) ගප්පි.

15.ඒක දේශීක විසිතුරු මසුන් කාණ්ඩය නිවැරැදිව දක්වා ඇත්තේ,
(1) බුලත්හපයා, තඹලයා සහ ගප්පි.
(2) බුලත්හපයා, ගල් පාන්ඩියා සහ රැවුල් දණ්ඩයා.
(3) ගල් පාන්ඩියා, තෙලියා සහ ගුරාමි.
(4) තෙලියා, තඹලයා සහ ගුරාමි.

16.කොරල ඉලිප්පීම රෝගය ඇති කරන රෝග කාරකය වන්නේ,
(1) පරපෝෂිතයකි. (2) දිලිරයකි.
(3) වෛරසයකි. (4) බැක්ටීරියාවකි.

17.මොලුස්කාවන්ට අයත් මත්ස්‍ය නොවන සත්ව කාණ්ඩය නිවැරැදිව දක්වා ඇත්තේ,
(1) බෙල්ලා සහ දැල්ලාය. (2) ඉස්සා සහ දැල්ලාය.
(3) බෙල්ලා සහ කකුළුවා. (4) දැල්ලා සහ කකුළුවා.

18.නිතල වාසී අපෘෂ්ඨවංශික ජීවියකු වන්නේ,
(1) ජෙලි ෆිෂ්. (2) කොරල්. (3) පසඟිල්ලා. (4) මට්ටි.

19.ඉස්සන්ගේ මෘදු දේහ වර්ණයක් ඇති වීමට හේතු වන්නේ,
(1) කැල්සියම් ඌන වීම. (2) නුසුදුසු pH අගය.
(3) ප්‍රෝටසෝවා රෝග. (4) බැක්ටීරියා රෝග.

20.ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා කකුළුවන් ලබා ගන්නේ,
(1) ගංගා වලින්. (2) මුහුදේන්.
(3) කඩොලාන පරිසරයෙන්. (4) පොකුණු වලින්.

21.ග්ලැසිලේරියා භාවිතා කර නිෂ්පාදනය කරන්නේ,
(1) ජීව වායු. (2) ඒගාර්.
(3) සුවඳ විලවුන්. (4) මත්ස්‍ය ආහාර.

22.අඩු සූර්යා ලෝකය යටතේ මතු පිට වැඩෙන ශාකයක් වන්නේ,
(1) ක්‍රිප්ටොකොරයින්. (2) කෙටල.
(3) රවුන්ඩ්ලීෆ්. (4) වැලිස්නේරීය.

23.බීජ සහ බල්බ මගින් ප්‍රචාරණය වන ජලජ පැළෑටියක් වන්නේ,
(1) ඇමේසන් ස්ටොච්. (2) හයිඩ්‍රිල්ලා. (3) කෙකටිය. (4) ලුජ්වීජියා.

24.දිය ගොටුකොළ වල සිටුවීමට යොදා ගන්නේ,
(1) බල්බ. (2) ධාවක. (3) බීජ. (4) දඬු.

25.මත්ස්‍ය ආහාරයක ප්‍රෝටීන් වල වැදගත් කමක් වන්නේ,
(1) ගෙවී ගිය පටක අලුත් වැඩියාවට. (2) අස්ථි වර්ධනයට.
(3) ආහාරයේ සුවඳ වැඩි දියණු කිරීමට. (4) ජීවක්‍රියාවලි නැවතීමට.

26.මත්ස්‍ය ආහාරයක අඩංගු ක්ෂුද්‍ර ඛණිජ ලවණයක් වන්නේ,
(1) කැල්සියම්. (2) මැග්නීසියම්. (3) යකඩ. (4) සෝඩියම්.

27.කාබෝහයිඩ්‍රේට් ප්‍රභවයක් ලෙස මත්ස්‍ය ආහාරයකට එක් කළ හැක්කේ,
(1) සෝයා. (2) පොල්. (3) ඉස්සන්ගේ ඔලු. (4) හාල් නිවුඩු.

28.ජීවී ආහාර ලෙස යොදා ගන්නා සත්ව ප්ලවාංග කාණ්ඩය වන්නේ,
(1) ඇල්ගි සහ ආටිමයා. (2) පාන් පණුවන් සහ මදුරු කීටයන්.
(3) මොයිනා සහ ඇල්ගී. (4) ආටිමයා සහ රොටිෆර්.

29.වෙරළා සන්නා මුහුදේ නිතලවාසී මසුන් අල්ලා ගැනීමට භාවිත වන්නේ,
(1) කරමල් දැල්. (2) ත්‍රිත්ව දැල්. (3) බිලී පිත්ත. (4) රිටි පන්නය.

30.පතුලේ එලන කරමල් දැලක් වන්නේ,
(1) කට්ටා දැල්. (2) සාල දැල්. (3) කුම්බලා දැල්. (4) මෝර දැල්.

31.පාරම්පරික යාත්‍රා භාවිතයේ වාසියක් වන්නේ,
(1) දේශීය අමුද්‍රව්‍ය යොදා ගැනීම නිසා ආයු කාලය කෙටි වීම.
(2) යාත්‍රා කල හැකි දුර ප්‍රමාණය සීමිත වීම.
(3) දේශීය අමුද්‍රව්‍ය යොදාගන්න නිසා නිෂ්පාදන වියදම අඩුය.
(4) යත්‍රාව තුල ඉඩ කඩ සීමිත වීම.

32.අක්වෙරළ කලාපයට යොදාගත හැකි ධීවර යාත්‍රාවක් වන්නේ,
(1) ඩිංගි බෝට්ටු. (2) බහුදින යාත්‍රා. (3) වල්ලම්. (4) ඔරු.

33.මේදය අඩු මාළුවෙක් වන්නේ,
(1) ගල් මාළුවා. (2) සාලයා. (3) ගොඩයා. (4) හුරුල්ලා

34.ජලය ඉවත් කිරීමේ මූල ධර්මය යොදා මත්ස්‍ය අස්වනු පරිරක්ෂණය කරන ක්‍රමයකි,
(1) ශීතනය කිරීම. (2) තැම්බීම මගින්.
(3) ලුණු දැමීම. (4) පැසවීම.

35.මාළු දුම් ගැසීමට සඳහා භාවිතා කිරීමට සුදුසු වන්නේ,
(1) කොහොඹ දර. (2) ලුණු මිදෙල්ල දර.
(3) පැගිරි දර. (4) මැහෝගනී දර.

36.මාළු ඇඹුල් තියල් සඳහා ප්‍රසිද්ධ පළාතක් වන්නේ,

(1) දකුණු පළාත. (2) මධ්‍යම පළාත.

(3) සබරගමු පළාත. (4) උතුරු මැද පළාත.

37.සුපෝෂණය වූ ජලාශයක් ලෙස හැඳින්විය හැක්කේ,

(1) සමනල වැව. (2) බේරේ වැව.

(3) නුවර වැව. (4) තිසා වැව.

38.ජලජ පරිසරයක සියලු ජීවීන් හා මසුන්ගේ බිත්තර විනාශ වීමට හේතු වන්නේ,

(1) රොන් මඩ එකතු වීම. (2) ඩයිනමයිට් යෙදීම.

(2) පොලිතීන් එකතු වීම. (4) නැව් වල තෙල් මගින්.

39. 1996 වර්ෂයේදී ඉස්සන් වගාව ඇතිවූ තර්ජනයක් වන්නේ,

(1) පටි පණුවන් ආසාදනය. (2) වරල් කුණු වීම.

(3) අසමතුලිත පෝෂණය. (4) සුදු පුල්ලි රෝගය ඇති වීම.

40.අගය එකතු කළ මත්ස්‍ය නිෂ්පාදනයක් වන්නේ,

(1) ජාඩි. (2) ඇඹුල් තියල්.

(3) උම්බලකඩ. (4) මාළු බෝල.